පරිපාලන වාර්තාව -1976.

1976 වර්ෂය (76.01.01 - 76.12.31) සඳහා
ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වාර්තාව.

1970 අංක 17 දරණ ලං.ජා.පු.සේ.ම. පනතේ 19(1)(ඇ) වගන්තිය ප්‍රකාර සකස් කර ඉදිරිපත් කෙරණි.

1. මණ්ඩලය.

1975 නොවැම්බර් මස 24 වැනි දින සිට බලපවත්වන පරිදි, මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටි ඩබ්ලිව්.බී.දොරකුඹුර මහතා මණ්ඩලීය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුව, 1976 ජනවාරි මස 09 වැනි දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ඊ.ඩී.ටී.කුලරත්න මහතා ගේ පත්වීමෙන් පුරවනු ලැබිය.

1970 අංක 17 දරණ ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතෙහි 2 වන ඡේදයෙහි 1 වැනි වගන්තියේ ප්‍රකාර, 1971 මැයි මස 13 වැනි දින පත් කරන ලද මණ්ඩලයේ සේවා කාලය නිමවීම නිසා 1976 මැයි මස 17 වැනි දින ක්‍රියාත්මක වන පරිදි නව මණ්ඩලයක් ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් පත් කරන ලදී. යටකී පනතෙහි 5 වැනි ඡේදයේ 1 වැනි වගන්තිය යටතේ මණ්ඩලයේ සභාපති වශයෙන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් යූ.ඩී.අයි.සිරිසේන මහතා පත් කරනු ලැබීය. නව මණ්ඩලයට පත් කරන ලද අනිකුත් සාමාජිකයින්ගේ නම් මෙසේය; එස්.යූ.සෝමසේකරම් මහතා, එම්.එම්.බහාඋද්දීන් මහතා, ඩබ්.ඊ.වී.එස්.ද අල්විස් මහතා, එස්.එෆ්.ලෝරෙන්ෂස් මහතා, ඊ.ඩී.ටී.කුලරත්න මහතා, බී.ඒ.ජයසිංහ මහතා සහ ඒ.පී.ඒ. මෙන්ඩිස් මහතා.

1975 දෙසැම්බර් මස 31 වැනිදා මණ්ඩලයේ අධ්‍යක්ෂ/ලේකම් කේ.ඩී.සෝමදාස මහතා විශ්‍රාම යෑමෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා එන්.අමරසිංහ මහතා 1976 ඔක්තෝම්බර් මස 01 වැනිදා සිට අධ්‍යක්ෂ/ලේකම් වශයෙන් පත් කරන ලදී. 1976 ජනවාරි මස 01 වැනිදා සිට 1976 ජූලි මස 31 වැනිදා දක්වා මණ්ඩලයේ ලේකම් වශයෙන් සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) ඩබ්ලිව්.එස්.ද සිල්වා මහතා වැඩ බලන ලදී. 1976 අගෝස්තු මස 01 වැනිදා සිට සැප්තැම්බර් මස 30 වැනිදා දක්වා, එම තනතුරේ වැඩ බලන ලද්දේ සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) එල්.ඒ. ගුණවර්ධන මහතා ය.

සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී. රැස්වීමකට සහභාගි වූ සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 06 කි.

2. පරිපාලනය.

වර්ෂය තුළ මණ්ඩලයේ පරිපාලන කටයුතු ඉතා සතුටුදායක අන්දමින් ඉටු කළ බව සඳහන් කිරීමට කැමැත්තෙමි. මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) තනතුරට අනුයුක්ත කොට සිටි ඩබ්.එස්.ද සිල්වා මහතා 1976 ජූලි මස 31 වැනි දින තම නිත්‍ය තනතුරට ආපසු යන ලදී. ඒ හේතුවෙන් ඇති වූ පුරප්පාඩුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය ලිපිකරු සේවාවේ 1 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන එල්.ඒ.ගුණවර්ධන මහතා [illegible]යකට අනුයුක්ත කරන ලදී. ඔහුගේ මෙම පත්වීම 1976 අගෝස්තු මස 01 වැනිදා සිට ක්‍රියාත්මක විය. 1976 දෙසැම්බර් මස 31 වැනි දින වන විට මණ්ඩලයේ සේවක සංඛ්‍යාව සම්පූර්ණව සිටියහ.

2/=.....

මණ්ඩලයේ ඇතැම් තනතුරුවල ඉහළ මට්ටමේ ශ්‍රේණි ඇති කිරීමට මණ්ඩලය විසින් කරන ලද යෝජනාවට ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අනුමැතිය ලැබිණ. දැනට එම යෝජනා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

3. <u>මහනුවර ප්‍රාදේශීය කාර්යාලය.</u>

වර්ෂය තුළදී මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ නිත්‍ය සේවා මණ්ඩලය සහකාර අධ්‍යක්ෂ වරියක් ඇතුළු පුස්තකාල සහකාර තිදෙනෙකුගෙන් හා එක් කාර්යාල කාර්ය සහායකයකුගෙන් සමන්විත විය. ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් මෙම වර්ෂය තුළදී මහනුවර, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, කෑගල්ල, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්කවල පුස්තකාල ප්‍රතිසංවිධානය හා සංවර්ධනයට අදාළ කටයුතු කරන ලදී. විශේෂයෙන්ම පුස්තකාලවල තැන්පත් වී ඇති පොත් තොග ක්‍රමානුකූලව සූචි ගත කොට වර්ග කිරීම ගැන අවධානය යොමු කරන ලදී. ඊ හැර, මහජන පුස්තකාල හා පාසැල් පුස්තකාල සේවයෙහි නිරත නුපුහුණු කාර්ය මණ්ඩලයට සේවාස්ථ පුහුණු පාඨමාලා කිපයක් ද සාර්ථකව පවත්වන ලදී.

4. <u>මණ්ඩලයේ අරමුදල.</u>

වර්ෂය ආරම්භයේ දී මණ්ඩලීය අරමුදලේ ශේෂය රු: 803,825.74 ක් විය. අදාල වර්ෂයට රජයෙන් ලැබුණු ආධාර මුදල එකතු වූ විට එය රු: 1,428,825.74 කි. මණ්ඩලයේ ස්ථාවර වත්කම් පහත සඳහන් පරිදි ය.

| | | |
|---|---|---|
| (අ) | ලී බඩු සහ කාර්යාල උපකරණ | - රු: 60,983.18 |
| (ආ) | මෝටර් රථය | - රු: 8,914.12 |
| (ඇ) | පුස්තකාල උපකරණ | - රු: 70,014.04 |
| (ඈ) | පොත්පත් | - රු: 228,542.64 |

මණ්ඩලයේ බැංකු ගිණුම උද්‍යාන වීදියේ මහජන බැංකුවේ පවත්වා ගෙන යන ලදී. වර්ෂයේ ආරම්භය වන විට එහි ශේෂව තිබුණු මුදල් ප්‍රමාණය රු: 67,572.47 ක් විය.

කාර්ය මණ්ඩලයේ ඇප මුදල් වශයෙන් රු: 8,180.00 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් වී ඇත.

පසුගිය වර්ෂයෙහි මණ්ඩලයේ මුදල් පරිපාලනය සම්බන්ධ ඔඩිටර් ජනරාල් තුමාගේ වාර්තාවෙහි මෙසේ සඳහන් කොට තිබේ.

> "පොදු සම්මත ගණක මූලධර්ම අනුගමනය කරමින් පසු ගිය වර්ෂයේ යොදා ගනු ලැබූ පදනම් මත සතුටුදායක ලෙස ගිණුම් පිළියෙළ කර තිබුණු බව මාගේ අදහස යි."

5. <u>සේවාවන්.</u>

(1) පසුගිය වර්ෂවලදී සංවර්ධනය සඳහා තෝරා ගනු ලැබූ පුස්තකාලවල තිබුණු ගොඩනැගිලි සහ සේවක අඩුපාඩුකම් නිසා, ආධාර ලබා ගැනීමට සුදුසුකම් නො ලැබූ පුස්තකාල ද මෙම වර්ෂයේ වැඩ පිළිවෙළට ඇතුළත් කරන ලදී. එම පුස්තකාල ඇතුළුව මෙම වර්ෂයේ දී කෑගල්ල, මඩකලපුව, බදුල්ල, මොණරාගල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල පුස්තකාල සඳහා මණ්ඩලයේ සංවර්ධන ආධාර ව්‍යාප්ත කරන ලදී.

3/......

මණ්ඩලීය ව්‍යාපාර වැඩ පිළිවෙළ යටතේ පැවැති පොත් ආධාර වැඩ පිළිවෙළ ට ඇතුලත් පුස්තකාලවලට පොත් සැපයීම 1972 වර්ෂයේ පටන් ගන්නා ලදි. එහි ප්‍රතිඵලය වූයේ බෙදා හැරීම සඳහා විශාල පොත් තොගයක් අවශ්‍ය වූ බවත්, ගබඩාවේ එක්තැන්ව තිබූ පොත් බෙදා හැරිය බවත් ය. වර්ෂය තුල පොත් ආධාර ව්‍යාපාරය යටතේ රු: 118,268.13 ක් වටිනා පොත් පුස්තකාලවලට බෙදා හරින ලදි. ගබඩාවෙහි රැඳී තිබුණු ආසියා පදනම මගින් වර්ෂ කිහිපයකට ඉහතදී මණ්ඩලයට ප්‍රදානය කරන ලද සැහෙන ඉංග්‍රීසි පොත්පත් තොගයක් ද පාසැල් පුස්තකාලවලට බෙදා හැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දෙන ලදි.

මණ්ඩලීය පොත් ආධාර ව්‍යාපාරයෙහි වටිනා අංශයක් වූ "පොත් හුවමාරු සේවාව" පසුගිය වර්ෂයේ සැප්තැම්බර් මස මණ්ඩලීය මූලස්ථානයේ දී ආරම්භ කරන ලදි. මණ්ඩලීය ශාඛා කාර්යාලය විසින් පළමුවරට මහනුවර ප්‍රදේශයෙහි 1975 ජූනි මස ආරම්භ කරන ලද මෙම ක්‍රමයෙහි ජනප්‍රියත්වය හා වැදගත්කම ප්‍රත්‍යක්ෂ විය. සමස්ත ලංකා පදනමක් මත මෙම ක්‍රමය දැන් ව්‍යාප්ත කර ඇත.

පොත් ආධාර සේවා වැඩ පිළිවෙළ යටතේ "පොත් බැංකුව" පාලනය වනුයේ මූලස්ථානය මගිනි. එයින් කරනුයේ පුස්තකාල නිලධාරීන්ට මාරුවෙන් මාරුවට පොත් හුවමාරුවට දීම යි. එම පොත් බෙදා හැරීම කරනුයේ පොත් 50 කින් සමන්විත කට්ටලය බැගින් අසුරන ලද පොත් පෙට්ටි පාවිච්චි කර, බෙදා හැරීමෙනි. පිරුළට ලබා ගන්නා පොත් තුන් මසක් තබා ගත හැක. මෙම සේවය සඳහා බොහෝ ඉල්ලීම් ඇති හෙයින් මීළඟ අවුරුද්ද ඇතුළත පිරළු පුස්තකාල සාමාජික සංඛ්‍යාව 62 සිට 100 දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

පසුගිය වර්ෂයේ දී ආරම්භ කරන ලද රින්ෂර්ලි පුස්තකාල සේවා තෑගි පොත් වැඩ පිළිවෙළ නිසා මණ්ඩලයෙන් පුස්තකාලවලට ලබාදෙන පොත් ආධාර බොහෝ දුරට වර්ධනය විය. රින්ෂර්ලි ආධාර ක්‍රමය යටතේ බ්‍රිතාන්‍යයේ පුස්තකාලවලින් ආපසු ගන්නා ලද හොඳ තත්ත්වයේ ඇති පොත්පත් විශාල සංඛ්‍යාවක් මණ්ඩලයට ලැබිණ. මෙම පොත් මහජන හා පාසැල් පුස්තකාල අතර බෙදා හරින ලදි. රින්ෂර්ලි පොත් අපේ පුස්තකාලවලට බොහෝ ප්‍රයෝජනවත් වන බවත්, ඒ හෙයින් මෙම පොත් සඳහා ඇති ඉල්ලීම වැඩි වන බවත් පෙනේ. විශේෂයෙන් ප්‍රබන්ධ ග්‍රන්ථ හා ළමා සාහිත්‍යය ජනප්‍රියත්වයට පත් වී තිබේ. විද්‍යාව සහ ගණිතය, අන්ධ සිසුන් සඳහා බ්‍රේල් පොත් හා ලොකු අකුරින් මුද්‍රිත පොත් විශාල ප්‍රමාණයක් වර්ෂය තුලදී ලැබීම කඩිනමින් වැඩි විය.

පසුගිය වර්ෂය ඇතුළත රින්ෂර්ලි ක්‍රමය මගින් පොත් 7484 ක් ලංකාවෙහි මහජන හා පාසැල් පුස්තකාල අතර බෙදා හැර ඇත. මෙම පොත්, තොග වශයෙන් තවතවත් ලැබෙමින් පවති.

## (II) පුස්තකාල අධ්‍යාපනය.

මීට ඉහත අවුරුදුවල දී මෙන්ම මෙම වර්ෂයේ ද කොළඹ සහ අතිකුත් ප්‍රදේශයන් හි පුස්තකාල අධ්‍යාපන පාඨමාලා පවත්වන ලදි. පාසැල් හා මහජන පුස්තකාලයන්හි ගුරුවරුන් හා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් හට ප්‍රථම වරට පුස්තකාලයාධිකාරීත්වය පිළිබඳ මූලික දැනුමක් ලබාදීම් වස් තාක්ෂණික සේවා හා පාඨක සේවාවන්ට සම්බන්ධ ප්‍රායෝගික කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් හැඳින්වීමේ පාඨමාලා ස්වරූපයෙන් පාති පැවැත්වීම අඛණ්ඩව කරගෙන යන ලදි. ගුරුවරුන් සඳහා පත්තල ගෙදර ගුරු විද්‍යාලයේ දී (සිංහල මාධ්‍යයෙන්) හා පලාලි ගුරු විද්‍යාලයේ දී (දෙමළ මාධ්‍යයෙන්) ද, පලාවත, හොරණ, පොළොන්නරුව, බදුල්ල හා බණ්ඩාරවෙලදී ද සේවාස්ථ පුහුණු පාඨමාලා පවත්වන ලදි. මොණරාගල දිස්ත්‍රික්කය ඇතුළුව බණ්ඩාරවෙල අධ්‍යාපන

ප්‍රදේශයන් හි මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන් සඳහා බණ්ඩාරවෙල දී පැවැත්වුණු දෙදිනක සම්මන්ත්‍රණය ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මෙහි අරමුණ වූයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පරීක්ෂක යින් හට පාසැල් පුස්තකාලයීය වැඩ කටයුතුවල විවිධ අංශයන් හි වැටහීමක් ලබා දීමයි. හැඳින්වීමේ පාඨමාලාවන්ට සහභාගි වූ පුස්තකාලයාධිපතීන් අතර මහජන පුස්තකාලයාධිපති හු 143 ක්ද, ගුරු පුස්තකාලයාධිපතිහු 143 ක්ද වූහ.

ඉහත සඳහන් කරන ලද පුහුණු කිරීමේ පාඨමාලාවන්ට අතිරේකව මහජන පුස්තකාල හා දෙපාර්තමේන්තු පුස්තකාලවල සේවය කරනු ලබන පුස්තකාලයාධිපතීන් 5 දෙනකු හට කොළඹ මහජන පුස්තකාලයෙහි සේවාස්ථ පුහුණුවක් ලබාදීමට කටයුතු සලසන ලද අතර, රත්නපුර ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා එක් දින සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.

පුහුණුවීමේ පංති හා සේවාස්ථ වශයෙන් දැනට වඩා උසස් මට්ටමකින් ඊළඟ වර්ෂයේ දී පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරගෙන යනු ලැබේ. පුස්තකාලයාධි-පතීන්ට, ඔවුන්ගේ වෘත්තීය දැනුම දියුණු කර ගැනීමටත්, පුස්තකාල විද්‍යාව පිළිබඳ දැනුම පුළුල් කර ගැනීමටත් උපයෝගිවීමේ පරමාර්ථයෙන්, පුස්තකාල අධ්‍යාපනය පිළිබඳ තැපැල් මාර්ගික පාඨමාලාවක් ආරම්භ කිරීමේ යෝජනාව මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම පාඨමාලාවේ කාලය අවුරුදු 2 ක් වන අතර එම විභාගය කොටස් 2 කින් යුක්ත ය. විභාගය, විභාග කොමසාරිස්තුමා විසින් පවත්වනු ඇත.

(III) ක්ෂේත්‍ර සේවාවන්.

පුස්තකාලයන්හි ප්‍රතිසංවිධාන හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වෘත්තීය උපදෙස් සැපයීම සඳහා මූලස්ථාන කාර්යාලයෙන් මෙන්ම මහනුවර ප්‍රාදේශීය කාර්යාලයෙන් නිලධාරීහු නොකඩවා පුස්තකාල පරීක්ෂා කිරීමෙහි යෙදී සිටියහ. මීට අමතරව ගොඩනැගිලි, ලීබඩු උපකරණ සහ වෙනත් ඒ සම්බන්ධ කරුණු සඳහා පුස්තකාලයන්හි ඉල්ලීම මත වෘත්තීය උපදෙස් ලබා දී ඇත. පුස්තකාල ලීබඩු සහ තාක්ෂණික ගැටළු සම්බන්ධ උපදෙස් සහ විශේෂ ප්‍රමිතීන් මණ්ඩලය විසින් සපයා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි පර්යේෂණ අංශයේ අනුග්‍රහය ද ඇතිව ගුරු මණ්ඩලය සඳහා කාමරයක්ද, පරිපාලන අංශයක් ද සහිත පාසැල් පුස්තකාල ගොඩනැගිල්ලක සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන ලදී. මුදල් තත්ත්වය අනුව මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්ට දන්වා යැවීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ විය.

6. කමිටු රැස්වීම් සහ සාකච්ඡා.

පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් සහ උපකාර කිරීමට මහජන, පාසැල් පොත් තේරීම් සහ ග්‍රන්ථනාමාවලි කමිටු රැස්වීම් 14 ක් වර්ෂය තුළ පවත්වන ලදී.

ඉතා ප්‍රයෝජනවත් යයි සැලකෙන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළ පිළිබඳ සාකච්ඡාවන් කිහිපයක් ප්‍රදේශයන් කීපයක පාසැල් ප්‍රධානාචාර්යවරුන් සහ අධ්‍යාපන නිලධාරීන්, පුස්තකාල සේවා මණ්ඩලයෙහි සභාපති සහ සහකාර අධ්‍යක්ෂතුමා සමග එම වර්ෂයේ දෙවැනි භාගයෙහි පවත්වන ලදී. එම වැඩ පිළිවෙළ ඉතාමත් ඵලදායී බැවින් ඉදිරි වර්ෂවලදීත් එය දිගට ම පවත්වා ගෙන යෑමට යෝජනා කරන ලදී.

5/=.....

ගුරු විද්‍යාලවල පුස්තකාල සංවර්ධනය ගැන විශේෂ අවධානය යොමු කළ යුතු බව යෝජනා කොට ඇත. මේ සම්බන්ධයෙන්, මූලික පියවරක් වශයෙන් ගුරු විද්‍යාලවල දැනට ඇති පුස්තකාල පහසුකම්වල තත්ත්වය සොයා බැලීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී.

7. <u>ජාතික ග්‍රන්ථනාමාවලිය.</u>

මුද්‍රණකරු විසින් ග්‍රන්ථනාමාවලි මුද්‍රණය පිළිබඳ අත්සන් කරන ලද ගිවිසුම කඩ කළ හෙයින් මුද්‍රණ කටයුතු තාවකාලිකව පමා විය. එහෙත් 1976 ජූලි 14 වැනි දින වෙනත් කොන්ත්‍රාත්කරුවකු සමග එළඹි ගිවිසුමක් අනුව එහි වැඩ යළිත් ආරම්භ කරන ලදී. ග්‍රන්ථනාමාවලි අංශය විසින් නිම කළ කාර්යයන් පහත දැක් වේ.

<u>නිත්‍ය සේවාවන්.</u>

<u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1972 කලාපය අංක 5 - 12:</u>

පසුගිය වර්ෂයේ දී මෙම කලාපයේ අත් පිටපත රජයේ මුද්‍රණාලයාධිපති ට භාර දෙන ලදී. මෙහි කොටස් හයෙන් පහක ශෝධ්‍ය පත්‍ර බලා මුද්‍රණය අනුමත කරන ලදී.

<u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1973 කලාපය:</u>

මෙම කලාපයේ සංස්කාරක කටයුතු එන්. අමරසිංහ මහතා ට කොන්ත්‍රාත්තුවක් මගින් පවරන ලදී. එහි සංස්කරණ කටයුතු අවසාන වී ඇත.

<u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1974 කලාපය:</u>

මෙම කලාපයේ මූලික සංස්කරණ කටයුතු ග්‍රන්ථනාමාවලි සහකාර අධ්‍යක්ෂ විසින් නිම කොට ඇත.

<u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1975 කලාපය:</u>

වර්ෂය තුළදී මෙම කලාපය මුද්‍රණය කොට බෙදා හරින ලදී.

<u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය 1976 කලාපය:</u>

මෙම කලාපයේ අත්පිටපත සම්පූර්ණයෙන් සකස් කොට නිම කරන ලදී. අංක 1-3 දක්වා මුද්‍රණය කොට බෙදා හරිනු ලැබීය. අංක 4-12 දක්වා මුද්‍රණකරුට භාර දී ඇත. මෙයින් අංක 4 සහ 5 හේ ශෝධ්‍ය පත්‍ර කියවා මුද්‍රණය අනුමත කොට තිබේ.

8. <u>ජාතික පුස්තකාල ව්‍යාපාරය.</u>

ජාතික පුස්තකාල ගොඩනැගිලි සෑදීම සඳහා රජයෙන් වෙන් කරන ලද ඉඩමේ බුක්තිය, 1976 දෙසැම්බර් මස 13 වැනි දින මණ්ඩලය විසින් භාර ගන්නා ලදී. ප්‍රමාණයෙන් අක්කර 2.2 ක් වූ මෙම ඉඩම පිහිටා ඇත්තේ, ටොරිංටන් ඇවනියුහි පැරණි තුරඟ තරඟ පිටියේ දැනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටා ඇති භූමි භාගයට යාබදව ය. ඉඩම පවරා ගත් දිනම, ගොඩනැගිලි කටයුතු ආරම්භ කිරීම සඳහා ගොඩනැගිලි හා ඉදි කිරීමේ අමාත්‍යාංශයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට එය භාර දෙන ලදී.

1977 වර්ෂය ආරම්භයේ දී ම ගොඩනැගිලි කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වුයෙන්, සැලසුම් හා ඉදි කිරීම් සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට උපදෙස් දීම සඳහා නැවත වරක් යුනෙස්කෝ විශේෂඥ මයිකල් බ්‍රෝන් මහතා ගෙන්වා ගැනීමට මණ්ඩලය තීරණය කළාය.

6/=.....

ඒ අනුව 1976 දෙසැම්බර් මස 12 වැනි දින ලංකාවට පැමිණි බ්‍රෝන් මහතා රජයේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පී ගොඩනැගිලි හා ඉදි කිරීම් අමාත්‍යාංශයේ නිලධාරීන්, සැලසුම් හා ආර්ථික අමාත්‍යාංශ නිලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත් වූයේ ය. ආපසු එංගලන්තය බලා යෑමට පෙර මණ්ඩලය ඇමතූ බ්‍රෝන් මහතා, ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන් කිසිම ගැටලුවක් උද්ගත නොවන බව තමාට විශ්වාස යැයි සඳහන් කළේ ය. ඔහුගේ එම අදහස ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුවරයා හා කාර්‍ය භාර ගෘහ නිර්මාන ශිල්පීන් විසින් ද අනුමත කරන ලදී.

ජාතික පුස්තකාලය ගොඩ නැගීම සඳහා වියදම් වෙතැ යි ඇස්තමේන්තු කළ රුපියල් දශ ලක්ෂ 11.5 ක මුදල සැලසුම් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් අනුමත කොට ඇති අතර, අවශ්‍ය මුදල් ලබා දෙන බවට ප්‍රතිඥා දී තිබේ. මෙරට ඇති දුර්ලභ වටිනා පොත් පත් පිටරට වලට ඇදී යැම ගැන සැලකිල්ල යොමු කළ මණ්ඩලය ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා පොත්පත් එකතු කිරීම ගැන විශේෂ අවධානය යොමු කරන ලදී. පුස්තකාල ගොඩනැගිල්ල තනා නිමවන තුරු මෙම පොත්පත් තැන්පත් කොට තැබීම සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් සොයා ගත යුතු බව මණ්ඩලයේ තීරණය විය. ඒ අනුව වර්ග අඩි 3,200 ක භූමි ප්‍රමාණයකින් යුත් තාවකාලික ගොඩනැගිල්ලක් මණ්ඩලයේ මූලස්ථානයට නුදුරින් බද්දට ගැනීමට තීරණය කරන ලදී. දුර්ලභ හා වටිනා පොත් පත් මිළදී ගැනීම සඳහා රුපියල් 100,000/= ක මුදලක් ද මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ජාතික පුස්තකාල ගොඩනැගිල්ල නිම වන අවස්ථාව වන විට සෑහෙන පොත් එකතුවක් [illegible] [illegible] මණ්ඩලය අදහස් කරයි.

9. <u>අතිරේක සේවාවන්.</u>

(අ) අයිසොරිඩ් - මෙම වැඩ පිළිවෙළ අධ්‍යක්ෂ විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ආ) ලංකා වාර සඟරා පිළිබඳ තොරතුරු නාමාවලිය පසු ගිය වර්ෂයේ ආරම්භ කරන ලදින් මේ වර්ෂයේ ද එය ගොඩ නැගීමට කටයුතු කරන ලදී.

(ඇ) ජාතික ග්‍රන්ථ ප්‍රකාශකවරුන් පිළිබඳ විස්තර ඇතුළත් නාමාවලියක් සකස් කොට 1976 ජාතික ග්‍රන්ථනාමාවලියේ, 1 වැනි කලාපයේ ප්‍රකාශයට පත් කරන ලදී. එම නාමාවලිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රයෙන් ම පිළියෙළ විය.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රවෘත්ති පත්‍ර සූචිය සකස් කිරීම නොකඩවාම කර ගෙන යන ලදී.

(ඉ) 1962 සිට අද දක්වා ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ ඇතුළත් වන පොත්පත් පිළිබඳ ඒකාබද්ධ සූචිය පවත්වා ගෙන යන ලදී. විෂයානුකූල ඒකාබද්ධ සූචිය දැනට නිම වී ඇත. 1962 සිට 1969 දක්වාද, 1970 සිට ඉදිරි සත් අවුරුද්ද දක්වා ද යනුවෙන් 10,000 කට අධික සූචිපත් වලින් යුක්ත සප්ත වාර්ෂික ඒකාබද්ධ සූචි දෙකක් දැනට සකස් කොට තිබේ. ඉංග්‍රීසි හා දෙමළ ග්‍රන්ථ සම්බන්ධයෙන් සූචි සටහන් 8,500 ක පමණ සූචියක් ද, [illegible] පිළියෙළ කරන ලදී.

(ඊ) 1976 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වන පරිදි ප්‍රවෘත්ති පත්‍ර පිළිබඳ 1976 අංක 5 දරණ සංශෝධිත ආඥා පනත හා 1976 අංක 6 දරණ මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයින් ගේ සංශෝධිත ආඥා පනත ක්‍රියාත්මක වූ හෙයින් මෙම පනත්වලට අනුකූලව මෙරට මුද්‍රණය වන පොත්, වාර සඟරා හා ප්‍රවෘත්ති පත්‍රවල පිටපත් තැන්පත් කිරීම සඳහා දැන් මණ්ඩලයට ලැබේ. මෙම තැන්පත් පිටපත්, ජාතික පුස්තකාල එකතුවේ ආරම්භය ලෙස සැලකිය හැක.

(උ) මහජන පුස්තකාල සඳහා සුදුසු පොත්පත් පිළිබඳ විස්තර ඇතුළත් ග්‍රන්ථ නාමාවලි සිංහල හා දෙමළෙන් පිළියෙළ කොට රෝනියෝ පිටපත් කොට බෙදා හරින ලදී.

(ඌ) මහජන පුස්තකාල පිළිබඳ විස්තර ඇතුළත් ඩිරෙක්ටරියක් පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු රැස් කරන ලදී. මීළඟ වර්ෂය ඇතුළත දී මෙම ලේඛණය නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

(එ) පුස්තකාල ප්‍රවෘත්ති - 1975 ජූලි සිට 1976 දෙසැම්බර් දක්වා කාලයට අදාළ කලාප ඒකාබද්ධ කොට වෙළුම් අංක 3,4 කලාපය යනුවෙන් නිකුත් කරන ලදී.

## 10. සමාප්තිය.

ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවා වර්ධනය කිරීමෙහි ලා පසු ගිය මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් විසින් ඉටු කරන ලද සේවය අගය කරන බව වාර්තා කිරීමට කැමැත්තෙමි.

මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් විවිධ වෘත්තියමය සංවිධානවලින් ලැබුණු සහයෝගය ද, ගරු අධ්‍යාපන ඇමතිතුමන් ද, එතුමාගේ ලේකම් හා අතිරේක ලේකම් විසින් සහ ප්‍රධාන ගණකාධිකාරී ඇතුළු අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන් විසින් මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් දක්වනු ලද සැලකිල්ල හා දෙන ලද සහයෝගය කෘතඥතාපූර්වකව සටහන් කර තැබීමට කැමැත්තෙමි.

මණ්ඩලයේ සභාපති වශයෙන් මා පත් වූ පසු මණ්ඩලයේ සාමාජිකයින් ගෙන් මට ලැබුණු සහාය හා සහයෝගය ද මම ඉතා අගය කොට සලකමි.

යූ. ඩී. අයි. සිරිසේන,
සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

1977.04.27 වැනිදා.
72, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 04.

/එස්ඊ.

ඇමුණුම.

# පොත් ආධාර වැඩ පිළිවෙළ - 1976

## (I) කෑගල්ල දිස්ත්‍රික්කය

### (අ) පාසැල් පුස්තකාල:

| පුස්තකාලයේ නම | මැතිවරණ කොට්ඨාශය |
|---|---|
| 1. කෑ/බාලිකා ම.වි., කෑගල්ල. | කෑගල්ල |
| 2. කෑ/මාණ්ඩලික මධ්‍ය පුස්තකාලය, කෑගල්ල. (අතිරේක) | කෑගල්ල |
| 3. කෑ/තෝලංගමුව ම.ම.වි., | දැදිගම |
| 4. කෑ/පිංදෙණිය ම.වි., අටාල. | ගලිගමුව |
| 5. කෑ/කල්යාණි ම.වි., කිතුල්ගල. | යටියන්තොට |
| 6. කෑ/මයුරපාද ම.වි. | මාවනැල්ල |
| 7. කෑ/රාජසිංහ ම.ම.වි. | රුවන්වැල්ල |
| 8. කෑ/සිරිසමන් ම.වි. | දෙහිඕවිට |
| 9. කෑ/දිප්පිටිය මුස්ලිම් ම.වි., අරණායක. | අරණායක |

### (ආ) මහජන පුස්තකාල:

| | |
|---|---|
| 1. මහජන පුස්තකාලය, කෑගල්ල න.ස. | කෑගල්ල |
| 2. මහජන පුස්තකාලය, වරකාපොල සු.න.ස. | දැදිගම |
| 3. මහජන පුස්තකාලය, ඕතරගම්දොළහ පත්තු ග.ස. | ගලිගමුව |
| 4. මහජන පුස්තකාලය, යටියන්තොට සු.න.ස. | යටියන්තොට |
| 5. මහජන පුස්තකාලය, මාවනැල්ල සු.න.ස. | මාවනැල්ල |
| 6. මහජන පුස්තකාලය, රුවන්වැල්ල සු.න.ස. | රුවන්වැල්ල |
| 7. මහජන පුස්තකාලය, දැරණියගල ග.ස. | දෙහිඕවිට |
| 8. මහජන පුස්තකාලය, රඹුක්කන සු.න.ස. | රඹුක්කන |

## (II) මඩකලපුව දිස්ත්‍රික්කය

### (අ) පාසැල් පුස්තකාල:

| පුස්තකාලයේ නම | මැතිවරණ කොට්ඨාශය |
|---|---|
| 1. මඩ/සිංහල ම.වි. | මඩකලපුව |
| 2. මඩ/ශිවානන්ද ම.වි. | මඩකලපුව |
| 3. මඩ/චන්දරමූලෙයි ම.ම.වි., වෙන්කලඩි. | මඩකලපුව |

### (ආ) මහජන පුස්තකාල:

| | |
|---|---|
| 1. මහජන පුස්තකාලය, කට්ටන්කුඩි සු.න.ස. | මඩකලපුව |
| 2. මහජන පුස්තකාලය, වාලච්චේනයි ග.ස. | කල්කුඩා |
| 3. මහජන පුස්තකාලය, පළුගමම් ග.ස. | පදිරිප්පු |

## (III) බදුල්ල දිස්ත්‍රික්කය

### (අ) පාසැල් පුස්තකාල:

| පුස්තකාලයේ නම | මැතිවරණ කොට්ඨාශය |
|---|---|
| 1. බ/බණ්ඩාරවෙල ම.වි., බණ්ඩාරවෙල. | බණ්ඩාරවෙල |
| 2. බ/බදුල්ල ම.වි., බදුල්ල. | බදුල්ල |
| 3. බ/මහියංගනය ම.වි., මහියංගනය. | මහියංගනය |
| 4. බ/පස්සර ම.ම.වි., පස්සර. | පස්සර |
| 5. බ/හපුතලේ ම.වි., හපුතලේ. | හපුතලේ |
| 6. බ/දික්වැල්ල ම.වි., හාලිඇල. | සොරණාතොට |
| 7. බ/බක්මීදෙල්ල ම.වි., කන්දකැටිය. | මහියංගනය |
| 8. බ/අල්-අදන් ම.වි., බදුල්ල. | බදුල්ල |

### (ආ) මහජන පුස්තකාල:

| | |
|---|---|
| 1. මහජන පුස්තකාලය, බදුල්ල මහ නගර සභාව. | බදුල්ල |
| 2. මහජන පුස්තකාලය, බණ්ඩාරවෙල න.ස. | බණ්ඩාරවෙල |
| 3. මහජන පුස්තකාලය, හපුතලේ නගර සභාව. | හපුතලේ |
| 4. මහජන පුස්තකාලය, පස්සර සු.න.ස. | පස්සර |
| 5. මහජන පුස්තකාලය, වැලිමඩ සු.න.ස. | වැලිමඩ |
| 6. මහජන පුස්තකාලය, හාලිඇල සු.න.ස. | සොරණාතොට |
| 7. මහජන පුස්තකාලය, ඌව-පරණගම ග.ස. | ඌව-පරණගම |
| 8. මහජන පුස්තකාලය, මහියංගනය ග.ස. | මහියංගනය |

## (IV) මොණරාගල දිස්ත්‍රික්කය

### (අ) පාසැල් පුස්තකාල:

| | |
|---|---|
| 1. බිබිල ම.වි. | බිබිල |
| 2. මහානාම ම.වි. | මොණරාගල |
| 3. දුටුගැමුණු ම.වි. | මොණරාගල |

### (ආ) මහජන පුස්තකාල:

| | |
|---|---|
| 1. මහජන පුස්තකාලය, වැල්ලවාය ග.ස. | මොණරාගල |
| 2. මහජන පුස්තකාලය, බිබිල සු.න.ස. | බිබිල |

## (V) පොළොන්නරුව දිස්ත්‍රික්කය

### (අ) පාසැල් පුස්තකාල:

| | |
|---|---|
| 1. රාජකීය විද්‍යාලය. | පොළොන්නරුව |
| 2. මින්නේරිය ම.වි. | මින්නේරිය |
| 3. මැදිරිගිරිය ම.වි. | මින්නේරිය |

(ආ) මහජන පුස්තකාල:

| පුස්තකාලයේ නම | මැතිවරණ කොට්ඨාශය |
| --- | --- |
| 1. මහජන පුස්තකාලය, හිඟුරක්ගොඩ සු.ත.ස. | මින්නේරිය |
| 2. මහජන පුස්තකාලය, මැදපත්තු ග්‍රා.ස. | පොළොන්නරුව |

## (vi) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

(අ) පාසැල් පුස්තකාල:

| | |
| --- | --- |
| 1. අග්‍රබෝධි ම.වි., කන්තලේ. | ත්‍රිකුණාමලය |
| 2. සිංහල ම.වි., ත්‍රිකුණාමලය. | ත්‍රිකුණාමලය |
| 3. පෙරුන්තෝරුවිග්නේශ්වර විද්‍යාලය. | ත්‍රිකුණාමලය |
| 4. ශාන්ත මේරි ම.වි., ත්‍රිකුණාමලය. | ත්‍රිකුණාමලය |

BOARD DOCUMENT NO.131

**CEYLON NATIONAL LIBRARY SERVICES BOARD**
**REPORT FOR THE YEAR 1976 (01.01.76 - 31.12.76)**
**PREPARED AND SUBMITTED IN TERMS OF SECTION**
**19 (1) (d) - C.N.L.S.B. ACT NO. 17 OF 1970.**

## 1. THE BOARD

The vacancy caused by the resignation of Board member Mr. W. B. Dorakumbura with effect from 24th November, 1975 was filled by the appointment of Mr. E.D.T.Kularatne, Senior Assistant Librarian of the University of Sri Lanka, Colombo Campus with effect from 9th January 1976.

On the expiry of the term of office of the Board appointed on 13th May 1971 by the Hon'ble Minister of Education in terms of section 2:1 of the Ceylon National Library Services Board Act. No. 17 of 1970, a new Board was appointed with effect from 17th May 1976. Mr. U.D.I. Sirisena, Deputy Director-General of Education was appointed the Chairman of the new Board, in terms of section 5.1 of the Act. The other members of the reconstituted Board were Messrs. S.U.Somasekeram, M.M.Bahaudeen, W.E.V.S.de Alwis, S.F.Laurentius, E.D.T.Kularatne, B.A.Jayasinghe and Mr.A.G.A.Mendis.

The Vacancy resulting from the retirement of Mr. K.D. Somadasa, Director/Secretary of the Board with effect from 31st December 1975 was filled by the appointment of Mr. N. Amarasinghe as Director/Secretary with effect from 1st October, 1976. Mr. W.S.de Silva, Assistant Director/Administration acted as Secretary to the Board from 1st January 1976 to 31st July, 1976 and Mr. L.A.Gunawardena who succeeded Mr. de Silva as Assistant Director/Administration acted as Secretary to the Board from 1st August 1976 to 30th September,1976.

During the year, 12 Board meetings were held and the average attendance was 6.

## 2. ADMINISTRATION

The administration of the Board during the year was very satisfactory. Mr. W.S. de Silva who was seconded for services in the Board as Assistant Director/Administration reverted to his substantive post in the public service on 31st July, 1976 and the resulting vacancy was filled by the secondment of Mr. L.A.Gunawardena for one year with effect from 1st August, 1976. Mr. Gunawardena was a Class I Officer in the general clerical services attached to the Ministry of Education. By 31st December 1976 the Board had its full complement of the administrative staff.

The proposals of the Board to create higher grades in certain posts in the cadre for its employees were approved by the Hon'ble Minister of Education and were submitted to the Ministry of Finance for approval.

## 3. REGIONAL OFFICE - KANDY

During the year, the permanent staff of the Kandy Regional Office comprised one Assistant Director, three Library Assistants and one peon. The Regional Office staff have assisted and advised the Public and School libraries in the Kandy, Anuradhapura, Polonnaruwa, Kurunegala, Kegalle, Badulla, and Moneragala districts in the re-organisation and development of libraries paying special attention to classification and cataloguing of books in stock. The Regional Office was also responsible for successfully conducting several in-service training programmes for the benefit of those working in libraries in the Public and School Sectors.

## 4. BOARD FUNDS

The balance of the Board funds at the beginning of the year was Rs.803825.74. With the receipt of the annual grant it was Rs.1,428,825.74. The value of capital assets comprised of (

...../2

(a) office furniture and equipment Rs. 60,983.18. (b) Motor vehicle Rs. 8,914.12. (c) Library equipment Rs. 70,014.04. (d) Books etc. Rs. 228,542.64.

The Board continued to maintain its accounts with the People's Bank, Park Street, Branch. The balance standing to the credit of the Board at the end of the year was Rs. 67,572.47.

Cash securities of Board employees amounting to Rs. 8,180.00 were deposited in the National Savings Bank.

The auditor General's report on the Board's Financial management for the previous year stated as follows :-

"I am of the opinion that the accounts presented have been satisfactorily prepared on the basis of generally accepted accounting principles applied on a basis consistent with that adopted in the previous year."

5. SERVICES

(i) During the year, the services of the Board were extended specially to the revenue districts of Kegalle, Batticaloa, Badulla, Moneragala, Polonnaruwa, Trincomalee in addition to libraries in other areas which had been selected for development in the previous years, but had not been qualified to receive assistance due to lack of buildings, staff etc.

The book assistance programme of the Board included supply of books to libraries which came under the Board's project programme commenced as far back as 1972. In consequence, a large stock of books acquired for distribution and accumulated in the stores was issued. Books to the value of Rs. 118,268.13 were issued to libraries under the Book Assistance programme during the year. Also a sizeable stock of books in English donated to the Board some years back by the Asia Foundation and held in the stores was given over to the Ministry of Education for distribution to school libraries.

A note worthy feature of the Board's Book Assistance Programme was the introduction of the 'book loan service' which was commenced at the Board Head-quarters in September last year. This scheme was first started in the Kandy region by the Board's branch office there in June 1975 and proved to be very useful and popular. The scheme has now been extended on an all-island basis.

Under the Book Loan Service Programme a book bank is maintained in the Head-quarters from which titles have been loaned in rotation to member libraries in boxes containing about 50 books each. The loan period at present is 3 months. There is a pressing demand for this service and it is proposed to increase the present membership of 62 libraries to 100 during the next year.

Book assistance to libraries by the Board was enhanced through the Ranfurly Library Services Gift Book Scheme which commenced last year. Under this scheme, the Board received a wide range of books in English withdrawn from British Libraries, but in good physical condition for distribution to public and school libraries here. Most of these books have been found to be very useful for our libraries and the demand for these, especially, popular fiction, children's Books. Books on Science and Mathematics and Books in Braille and books in large type has increased rapidly.

During the year under review 7484 books from the Ranfurly scheme have been distributed among public and school libraries in the Island. The Board continues to receive more stocks of these books.

(ii) LIBRARY EDUCATION

The Library education programme during the year was conducted both in Colombo and in the regions as in previous years. On account of the large number of teachers and officers from the school and public libraries who had to be provided with a basic knowledge of librarianship for the first time, classes continued to be conducted in the form of orientation courses, with special emphasis on practical work relating to technical services and readers' services. In-service training programmes for teachers were conducted at the Pattalagedera Teacher Training College (Sinhala), Palaly Teacher Training College (Tamil) and at Chilaw, Horana, Polonnaruwa, Badulla and Bandarawela. Special mention has to be made of the two days Seminar held at Bandarawela for the Cicuit Education Officers of Bandarawela education regions including the Moneragala district in order to familiarise the education supervisors with the various aspects of library work in schools. Of the librarians who followed the orientation course 143 were from Public libraries and 143 were from school libraries.

In addition to the above training programmes arrangements were made for 5 librarians of Public and Departmental libraries to receive In-service training at the Public Library, Colombo and a seminar of one days duration was organised for Public librarians at Ratnapura district at the office of the ACLG, Ratnapura.

Arrangements are being made to conduct the training programme at a higher level on a workshop/field work basis in the forthcoming year. The Board approved a proposal to start a correspondence course in library education designed specifically for the benefit of practising librarians with a view to improve their professional growth and help them obtain higher qualifications in librarianship. The duration of this course will be 2 years and the examination will consist of 2 parts. The examination will be conducted by the Commissioner of Examinations.

(iii) FIELD SERVICES

The staff from the Head-quarters as well as from the Kandy Regional Office have been visiting libraries regularly to provide professional advice in regard to re-organisation and development of libraries. In addition, professional advice was also provided on request to libraries with regard to buildings, furniture, equipment and other related matters. The Board issued instructions and specifications relating to library furniture and technical matters.

Action was taken with the assistance of the School Building Research Unit of the Ministry of Education to design a school library building-cum-staff room and administration block. This scheme was approved by the Ministry for circulation among Regional Directors for implementation depending on funds available.

6. COMMITTEE MEETINGS AND CONFERENCES

During the year 14 meetings of the Public, Schools, Book Selection and Bibliography Committees were held to advise and assist the Board with regard to library development programmes.

A number of conferences which proved to be very useful was held in the second half of the year in a number of regions where Principals of Schools and Education Officers met to discuss the Library Development Programme with the Chairman and Assistant Director, Library Services. It is proposed to continue this programme in the forthcoming years as this service was proved to be very fruitful.

It was proposed to pay special attention to the development of libraries in Teacher Training Colleges and as a preliminary step to this programme a survey was conducted to ascertain the quantum of existing library facilities in the training colleges.

.../4

7. THE NATIONAL BIBLIOGRAPHY

Printing of the Bibliography was temporarily interrupted due to defaulting by the printing contractor. However, an agreement was signed on 14th July 1976 with a new Contractor for printing and the work was resumed. The work done by the Bibliography Division is listed below:-

REGULAR SERVICES:

Sri Lanka National Bibliography - 1972 issues 5-12. This manuscript was handed over to the Government Printer last year. Five out of the six sections of this publication have been proof-read and passed for printing.

SRI LANKA NATIONAL BIBLIOGRAPHY 1973:

The editorial work for the annual volume was successfully contracted out to Mr.N.Amarasinghe. First stage of the compilation of the manuscript was over.

SRI LANKA NATIONAL BIBLIOGRAPHY 1974:

Primary editorial work on this annual volume has been completed by the Asst. Director/National Bibliography.

SRI LANKA NATIONAL BIBLIOGRAPHY 1975:

The printing and distribution of this Bibliography was completed during the year.

SRI LANKA NATIONAL BIBLIOGRAPHY 1976:

All manuscripts relevant to this bibliography i.e. issues No. 1 - 12 were compiled within the year itself, leaving no arrears. Issues No.1-3 were printed and distributed. Issues 4-12 were with the printer. Of these issues No. 4-5 have already been proof-read and passed for printing.

NATIONAL LIBRARY PROJECT

The Board took over on 13th December, 1976 the possession of the site released by the Government for the construction of buildings for the National Library of Sri Lanka. This site in extent 2.2 acres from old Race Course, Colombo, is situated on Torrington Avenue, adjoining the present premises of the Department of National Archives. On the same day, the site was handed over to the Department of Buildings, Ministry of Housing and Construction for commencement of the work on the building.

In view of the arrangements for the commencement of building operations in early 1977, the Board decided to obtain once again the services of Mr. Michael Brawne, the Unesco Consultant Architect from Britain to finalise the plans and advise the Buildings Department. Mr.Brawne arrived in the island on 12th December 1976 and had a number of discussions with the Chief Government Architect, Officials of the Ministry of Housing and Construction, Ministry of Planning and Economic Affairs and the Ministry of Education. On the eve of his departure, Mr. Brawne addressing the Board assured that he was satisfied that there would be no difficulties when the construction work commenced. This was corraborated by the construction Engineer and project Architects.

The Ministry of Planning and Economic Affairs has approved the entire estimate of Rs.11.5 million for this project and has assured the provision of necessary funds.

The Board gave high priority to the book collection for the National Library in view of the fact that many rare works were being smuggled out of the country. It was decided that until the National Library was constructed, temporary accommodation should be provided for the collection of books for the National Library. The Board, therefore, decided to rent out on a temporary basis a building with a floor area of about 3,200 sq. ft. for the purpose in the vicinity of the Board's Head-quarters. The Board approved a sum of Rs.100,000/=

for the purchase of rare and valuable books. It is expected that when the building is ready for occupation there would be an adequate collection of books for the National Library.

9. ADDITIONAL SERVICES

(a) ISORID: This project is now handled by the Director.
(b) The Sri Lanka Periodical Information List commenced last year has been maintained throughout the year.
(c) A publishers list (Sinhala, Tamil & English) was compiled and printed in the first issue of the Sri Lanka National Bibliography 1976. Only current publishers were included.
(d) Compilation of the Sri Lanka Newspaper Index continues.
(e) Cumulation of the Sri Lanka National Bibliography records accumulated since 1962 has been continued. The cumulation of classified subject section is now complete and a total of approximately 10,000 cards have been cumulated into two multilingual, classified 7 year sequences, 1962-1969 and 1970 onwards. English and Tamil author/title cumulations in similar sequences approximately 8,500 cards have also been successfully completed.
(f) The Newspaper Amendment Act. No. 5 of 1976 and Printers and Publishers Ordinance (Amendment) Act No.6, 1976 was implemented from September 1st, 1976 and the Board has begun to receive deposit copies of books, periodicals and newspapers printed after this date. This deposit material could be considered the nucleus of the National Library Collection.
(g) Select bibliographies of Books suitable for Public Libraries in Sinhala and Tamil were cyclostyled and issued to Libraries.
(h) Work was commenced on the compilation of a comprehensive Directory of Public Libraries and all relevant information has already been collected. It is proposed to publish the Directory during the next year.
(i) Library News :- During the year a cumulated volume (Vol. 3 No. 4 July 1975, December 1976 was issued.

10. CONCLUSION

I would wish to place on record an appreciation of the services rendered by the Chairman and members of the previous Board during their term of office for the promotion and development of library services in Sri Lanka.

I would also wish to place on record an appreciation of the assistance received from the various professional organisations in regard to the activities of the Board and also the understanding and sympathetic consideration given to all Board matters by the Hon'ble Minister of Education, his Secretary and Additional Secretary, the Chief Accountant and other officers of the Ministry.

I very much value the kind co-operation and support that I received from each and every member of the Board since my assumption of duties as Chairman.

U.D.I.Sirisena
Chairman
Ceylon National Library Services Board.

72, Bauddhaloka Mawatha,
Colombo 04.

27.04.1977

**ANNEXE**

## BOOK ASSISTANCE PROGRAMME - 1976

### (1) KEGALLE DISTRICT

### (a) SCHOOL LIBRARIES :-

| Name of the Library | | Electorate |
|---|---|---|
| 1. | K/Balika M.V. Kegalle. | Kegalle. |
| 2. | K/Circuit Central Library Kegalle (Additional) | Kegalle. |
| 3. | K/Tholangamuwa M.M.V. | Dedigama. |
| 4. | K/Pindeniya M.V. Atala | Galigamuwa. |
| 5. | K/Kalyani M.V. Kitulgala | Yatiyantota. |
| 6. | K/Maurapada M.V. | Mawanella. |
| 7. | K/Rajasinghe M.M.V. | Ruwanwella. |
| 8. | K/Sirisaman M.V. | Dehiowita. |
| 9. | K/Dippitiya Muslim M.V. Aranayake. | Aranayake. |

### (b) PUBLIC LIBRARIES :-

| | | |
|---|---|---|
| 1. | Public Library, Kegalle, U.C. | Kegalle. |
| 2. | Public Library, Warakapola, T.C. | Dedigama. |
| 3. | Public Library, Oteragamdolaha Pattu, V.C. | Galigamuwa. |
| 4. | Public Library, Yatiyantota, T.C. | Yatiyantota. |
| 5. | Public Library, Mawanella, T.C. | Mawanella. |
| 6. | Public Library, Ruwanwella, T.C. | Ruwanwella. |
| 7. | Public Library, Deraniyagala, V.C. | Dehiowita. |
| 8. | Public Library, Rambukkana, T.C. | Rambukkana. |

## (1V) MONARAGALA DISTRICT

### (a) SCHOOL LIBRARIES :-

| Name of the Library | Electorate |
|---|---|
| 1. Bibila M.V. | Bibila. |
| 2. Mahanama M.V. | Monaragala. |
| 3. Dutugemunu M.V. | Monaragala. |

### (b) PUBLIC LIBRARIES :-

| | |
|---|---|
| 1. Public Library, Wellawaya, V.C. | Monaragala. |
| 2. Public Library, Bibila, T.C. | Bibila. |

## (V) POLONNARUWA DISTRICT

### (a) SCHOOL LIBRARIES :-

| | |
|---|---|
| 1. Royal College, | Polonnaruwa. |
| 2. Minneriya M.V. | Minneriya. |
| 3. Medirigiriya M.V. | Minneriya. |

### (b) PUBLIC LIBRARIES :-

| | |
|---|---|
| 1. Public Library, Hingurakgoda, T.C. | Minneriya. |
| 2. Public Library, Medapattu V.C. | Polonnaruwa. |

## (V1) TRINCOMALEE DISTRICT

### SCHOOL LIBRARIES :-

| | |
|---|---|
| 1. Agrabodi M.V. Kantale | Trincomalee. |
| 2. Sinhala M.V. Trincomalee | Trincomalee. |
| 3. Perunthoruvigneshwara Vidyalaya | Trincomalee. |
| 4. St. Marys M.V. Trincomalee | Trincomalee. |

## (11) BATTICALOA DISTRICT

### (a) SCHOOL LIBRARIES :-

| Name of the Library | | Electorate |
|---|---|---|
| 1. | B/Sinhala Maha Vidyalaya | Batticaloa. |
| 2. | B/Shivananda M.V. | Batticaloa. |
| 3. | B/Vandarumoolai M.M.V. Chenkaladi | Batticaloa. |

### (b) PUBLIC LIBRARIES :-

| | | |
|---|---|---|
| 1. | Public Library, Kattankudy, T.C. | Batticaloa. |
| 2. | Public Library, Valachchanai, V.C. | Kalkuda. |
| 3. | Public Library, Palugamam, V.C. | Padirippu. |

## (111) BADULLA DISTRICT

### (a) SCHOOL LIBRARIES :-

| Name of the Library | | Electorate |
|---|---|---|
| 1. | B/Bandarawela M.V. Bandarawela. | Bandarawela. |
| 2. | B/Badulla M.V. Badulla. | Badulla. |
| 3. | B/Mahiyanganaya M.V. Mahiyanganaya | Mahiyanganaya. |
| 4. | B/Passara M.M.V. Passara | Passara. |
| 5. | B/Haputale M.V. Haputale | Haputale. |
| 6. | B/Dickwella M.V. [illegible] | Soranatota. |
| 7. | B/Bakmedilla M.V. Kandaketiya | Mahiyanganaya. |
| 8. | B/Al-adan M.V. Badulla | Badulla. |

### (b) PUBLIC LIBRARIES :-

| | | |
|---|---|---|
| 1. | Public Library, Badulla, M.C. | Badulla. |
| 2. | Public Library, Bandarawela, U.C. | Bandarawela. |
| 3. | Public Library, Haputale, U.C. | Haputale. |
| 4. | Public Library, Passara, T.C. | Passara. |
| 5. | Public Library, Welimada, T.C. | Welimada. |
| 6. | Public Library, Haliela, T.C. | Soranatota. |
| 7. | Public Library, Uva-Paranagama, V.C. | Uva-Paranagama. |
| 8. | Public Library, Mahiyanganaya, V.C. | Mahiyanganaya. |

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/27
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/27

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*